## පොඩි බුදුහාමුදුරුවනි!

දඹදිව දහම්සෝ පුතු
මෙහි වැඩිය දිනේ
අඹතල මත පොසොන්
සඳරැස් පතිත වුණේ
සදහම් අමා වැසි
වැස්වූ හතර කොනේ
ඔබ පා සිඹිමි
පොඩි බුදු හාමුදුරුවනේ

♦ **දුනිෂ ඉඳුනිල් යාපා**
**ගෝතමී විද්‍යාලය, ගම්පහ**

## ලක්දිව පළමු බුද්ධි පරීක්ෂණය

බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා වසර 236 කට පසුව දඹදිව ධර්මාශෝක අධිරාජයාගේ පුත් මහින්ද මහ රහතන් වහන්සේ ලංකාවට වැඩම කොට මෙරටට බුදු සමය හඳුන්වා දුන්හ.

මෙකල රාජ්‍ය පාලකයා වූ දේවානම්පියතිස්ස රජතුමාට උන්වහන් සේ හමුවූයේ අනුරාධ පුරයට ආසන්න මිහින් තලා වේදීය. රජුගේ බුද්ධිය පරීක්ෂා කිරීමට සිතූ මිහිඳු හිමි රජු ගෙන් ප්‍රශ්න කීපයක් ඇසීය. මෙම සිද්ධිය ලක්දිව පළමු බුද්ධිපරීක්ෂණය හැටියට පෙන්වා දිය හැකිය. මේ සඳහා මුල්කරගත්තේ අඹගසකි.


රජතුමා දුන් පිළිතුරු අනුව පසුව රජතුමා බුද්ධිමතෙකු බව උන්වහන්සේට අවබෝධ විය.

♦ **දිනුෂිකා සඳමාලි අමරසිංහ**
**ශාන්ත බර්නදෙත් විද්‍යාලය**
**පොල්ගහවෙල**
**Sri Lanka**




**Children's Corner**

## Ants කුහුඹුවන්



There are more than 10,000 species of ant. The can lift 20 times their body weight and have an average life span of 60 days. Adults cannot swallow solids but ingest the juice they squeeze from food. They have two stomachs - one which holds their food and a second for meals to be shared with other ants.

කුහුඹුවන් වර්ග 10,000 කට වඩා ලෝකයේ වසන බව සොයාගෙන ඇත. කුහුඹුවන්ට උන්ගේ ශරීරයේ බර මෙන් විසිගුණයක් බර ඉසිලිය හැකි බව කියති. උන්ගේ ජීවත්වීමේ කාලය සාමාන්‍යයෙන් දින 60 කි. වැඩිහිටි කුහුඹුවන්ට ඝන ආහාර වර්ග ගිලින්නට නොහැකි නිසා උන් කරන්නේ ආහාර වලින් මිරිකාගන්නා යුෂ දිරවාගැනීමයි. කුහුඹුවන්ට ආමාෂ දෙකක් ඇත. එකක් තම ආහාර ගබඩා කරගරන්මටද, අනෙක, කෑම වේල් අනෙක් කුහුඹුවන් සමග බෙදාගැන්මද සඳහාය.

♦ *Auntie Ramani* (**රමණි නැන්දා**)

## යළි වඩිනු මැනවි!

පොසොන් පුන් පොහෝ දිනේ
විහින්තලා ගල මත වැඩ හිඳ
තිස්ස නිරිඳුට දම් දෙසා
මේ ලක බුදු දහමින් නැහැවූ
මිහිඳු සමිඳුනේ

පිරිහී ගිය දහම් රැකගන්නට
බොදු දරුවන් බිහිකෙරුමට
සිරිලක සදහම් හඬ නංවන්නට
යළිත් වඩිනු මැන ලංකාවට

♦ **චාමිනි මධුවන්ති**
**ශ්‍රී සුදර්ශන දහම් පාසැල**
**නිල්පනාගොඩ, මිනුවන්ගොඩ**

## සුන්දර ගම්මානය

පුංචි පුංචි මල් පිපිලා
බලන්න හරි ලස්සනයි
අඹ ගස්වල ගෙඩි පිරිලා
ගම්මානෙම සුන්දරයි

බැග් කරට ගත් ළමයි
උදෑසනින් පාසැල් යයි
උදලු කරටගත් ගොවියන්
උදෑසනින් කුඹුරට යයි

**උමායා දේවනාරායන**
**ශා: මරියා කන්‍යාරාමය**
**මාතර Sri Lanka**


BOC

ලංකා බැංකුව
BANK OF CEYLON

ඔබට විශ්වාස තැබිය හැකි බැංකුවයි

ලන්ඩන් ශාඛාව

වසර 57 කටත් වඩා කාලයක් පුරා ලන්ඩන් නගරයේ ඔබේ මුදල් අවශ්‍යතා සපුරාලමින් සේවය කරයි.

හෙට දවසේ සිහින සැබෑකරන
NRFC ගිණුමක් අරඹන්න !
උපයාගත් විදේශ මුදලට වැඩි වටිනාකමක් !

ලංකා බැංකුව අනේවාසික ගිණුම් හිමියන් සඳහා නොමිළයේ ජීවිත රක්ෂණ ව්‍යාපෘතියක් යළි හඳුන්වා දෙයි.


පවුම්, ඩොලර්, යූරෝ හෝ රුපියල් වලින් ඔබ ශ්‍රීලංකාවට මුදල් යවන විට අපේ සේවා භාවිතා කරන්න. එය ඉතා සුරක්ෂිතය, ලාභදායකය, කාර්‍යක්ෂමය.

ශ්‍රීලංකාව පුරා ලංකා බැංකු ශාඛා 301 කි. ඉන් 256 කම කටයුතු පරිගණක ජාලගතකර ඇත. ඕනෑම ශාඛාවකින් පවුලේ අයට හෝ නෑදෑ හිතවතුන්ට මුදල් යැවීමේ දී එය ගිණුම් වලට බැරකිරීමට හෝ ශාඛාවේදී මුදල් අතටම ලබාදීමට හෝ හැකි ය.

★ ආකර්ෂණීය විනිමය අනුපාතිකය.
★ ඕනෑම වානිජ හෝ ඉතිරිකිරීමේ බැංකුවකට යැවිය හැක.

ඔබගේම චෙක්පත් **කළමනාකරු, ලංකා බැංකුව, ලන්ඩන්** යනුවෙන් ලියා, ගිණුම් හිමියාගේ නම, ගිණුම් අංකය, බැංකුවේ නම හා ශාඛාව දක්වා තැපැල් මගින් අපට යොමුකරන්න. (බ්‍රිතාන්‍ය මූල්‍ය රෙගුලාසිවලට යටත්ව)
වැඩි විස්තර සඳහා :

No 1, Devonshire Square, London EC2 M4WD
Phone : 020 7377 1888 Fax: 020 7377 5430
e-mail : bankofceylon.uk@btclick.com
Our Web - www.boc.lk
Nearest Railway Station - Liverpool Street ( tube & Rail ) Bishop Gate Exit

## පොතක් පතක්

## එවන් දෑසක්

**කතෘ - ගුණසිරි සේපාල වනිගරත්න**



ලංකාවේ සිට සිංහළ ලේඛන කලාවේ යෙදෙන කෙනෙකුට වඩා විදේශයක සිට සිංහලෙන් ලියන කෙනෙකු දෙස විශේෂත්වයකින් යුතුව බලන සිරිතක් ඇත. එයට හේතු කීපයකි. මූලික වශයෙන් තම රටින් බැහැරව ගියත් සිංහල බස අමතක නොකර එය භාවිතා කිරීමයි. එය කළ හැක්කේ සැබැවින්ම සිය මව්බසට ආදරයක් භක්තියක් ඇත්තෙකුට පමණි. දෙවැන් නම් විදේශීය නුහුරු පරිසරය තමා උපන් රටෙහි ඇසින් බලා ඊට කිසියම් අළුත් අර්ථ කථනයක් සපයන්නට එවැනි ලේඛකයෙකුට හැකිකම ලැබීමයි. ගුණසිරි සේපාල වනිගරත්නගේ එවන් දෑසක් නම් කෙටිකතා සංග්‍රහය ඉහතකී සිතිවිලි මා සිතට නැගීය.

ගුණසිරි වනිගරත්න වසර තිහකට වඩා කාලයක් එංගලන්තයේ සරේ ප්‍රාන්තයේ ජීවත්වන්නේය. ඉංග්‍රීසි සහ සිංහළ ද්විභාෂාවෙන්ම ලියන්නට හැකියාව ඇති ඔහු මේ පළකර ඇත්තේ මෙහි ආ අළුත ශ්‍රීලංකාවේ ප්‍රකට පුවත්පත් හා සඟරා ආදියට ලියන ලද කෙටිකතා කීපයකි.

ඔහුගේ කෙටිකතාවන්ට පාදකව ඇත්තේ ආදරය හා පවුල් ජීවිතත්, එයින් හටගන්නා චිත්ත වික්ෂෝපයන් ද පැහැදිලි කිරීමයි. ඒවා බොහෝ දෙනා අත්විඳි පොදු අත්දැකීම් වුවත් ගුණසිරි ඒ කරුණු ඉදිරිපත්කරන ආකාරය නිසාම එහි නැවුම් සහ අමුතු බවක් දක්නා ලැබෙයි. එය කතා කීමේ කලාව මනාව වටහාගත් කෙනෙකුගේ දක්ෂතාවයයි සිතමි.

ගුණසිරි ගාල්ල මහින්ද විද්‍යාලයේ නිශ්පාදනයකි. ඒ විදුහල බොහෝ දකුණේ විද්වතුන් බිහිකළ ආයතනයක් වෙයි. ඔහු ලේඛන කලාවට පන්නරය ලැබූයේ සිය විද්‍යාලයේ ප්‍රකාශනයන්ට දායකවෙමිනි. පසු කලෙක සුප්‍රකට ලේඛක ගුණදාස ලියනගේ ශූරීන්ගේ සහ ශ්‍රියා රත්නකාර මහත්මියගෙන්ද ලද ගුරුහරුකම් සහ රුකුල ගුණසිරිගේ සාහිත්‍යකරණයේ ඉදිරි ගමනට බෙහෙවින් බලපා ඇත.




පිටරටවලට සංක්‍රමණය වී කුටුම්භය රකිමින් ජීවත්වන බොහෝ සිංහළයින්ට සිංහලකම ද සිංහළ බසද අමතකව ගොස් බොහෝ කල්ය. සිංහලෙන් කතාකරන්නට පවා මැලිකමක් දක්වන ඔවුන් කෙසේනම් සිංහලෙන් අකුරු හතරක් ගලපා ලියද්ද? එවැනි කාලයක වසර තිස් ගණනක් මව්රටින් බැහැරව සිටිමින් සිංහළ කෙටිකතා පොතක් ලියා පළකරන්නට තරම් සිතක් උපන් ගුණසිරි සේපාල වනිගරත්න නම් ලේඛකයාණන්ට දෙස් විදෙස් හි වෙසෙන සිංහල පාඨකයින්ගේ අප්‍රමාණ තුති පැසසුම් හිමිවනු නිසැකය. එසේම සිය අත් දැකීම් ඔස්සේ යමින් එතෙර ජීවිතය නිරාවරණය කෙරෙන නවකතාවක් ඔහු වෙතින් මතු දින ලියවෙනවා ඇතැයි ද සිතමි.

♦ **වෙනුර**



**චාමිකා, දර්ශන, අනුර, උපාලි, මීපාලි සහ අර්ජුන රණතුංග**

# අනුරගේ අවසන් ලන්ඩන් ගමන

දැනට දෙමසකට පෙර අභාවප්‍රාප්ත අනුර බණ්ඩාරනායක මහතාගේ හොඳ කියන ගුණවර්ණනා කරන ඔහුගේ වියෝගය ගැන තවමත් කම්පා වන බොහෝ දෙන ඇතුවා නිසැකය. ලන්ඩන් නගරයේ වෙසෙන සිංහළ ජන කොටස අතරේ නම් එවැනි අය සිටින බව අපට නිතර හමුවන අය කියන දේවලින් පැහැදිලි වෙයි. ඒ අය අතරින් ලන්ඩනයේ ලිහිනියා වෙළඳ සැල සහ ආපන ශාලාව හිමි උපාලි හා මීපාලි ජෝතිරත්න යුවල විශේෂය. ඔවුන් අනුර නිතර මතකයට නගන්නේ ඔහු ඔවුන්ගේ ඉතා සමීප හිතවතෙකු ව සිටි නිසාය. එසේම ඔහු ළඟින් ඇසුරු කළ ව්‍යාපාරිකයෙකු වන පර්සි ජයවර්ධන මහතා ද තවමත් අනුරගේ අකල් වියෝගය ගැන දුක්වෙයි.

අනුර බන්ඩාරනායක මහතා ලන්ඩනයට ආ හැම විටකම පාහේ ලිහිනියා ආපන ශාලාවට ඇවිත් යන්නට අමතක නොකළේය. අවන්හලේ අමුත්තන් සඳහා සටහන් පොතක් තබා ඇත. බණ්ඩාරනායක මහතා ඒ ආ සෑම වරකම එම පොතෙහි කිසියම් හෘදයාංගම වැකියක් පැහැදිලි ව්‍යක්ත සිංහලෙන් ලියන්නට ද අමතක නොකරයි.

ඔහු බොහෝ විට ආවේ තවත් ශ්‍රීලාංකික මිතුරන් කීප දෙනෙකුද සමගය. දහවල් හෝ රාත්‍රි ආහාරය ගන්නා ඔහු ඒ ආහාරයන්හි රසවත්කම ගැන කියා ආපනශාලාව හිමි මීපාලි ජෝතිරත්න මහත්මියට සිය සතුට හා ස්තුතිය පළකරයි. ඔහු නික්ම යන්නේ ලන්ඩනයට එන ඊළඟ වතාවේත් නොවරදවා එන බව කියමිනි.

අවසන් වරට ආ කල්හිද ඔහු පිටව ගියේ යළි එන බව කියමිනි. එදා ලිහිනියා අවන්හලේ හිටපු ශ්‍රීලංකා ක්‍රිකට් නායක අර්ජුණ රණතුංග මහතා ද විය. මේ ඡායාරූපයේ මැද උපාලි මීපාලි යුවලත්, වම්පස ඔවුන්ගේ දියණිය චාමිකා හා බෑනා දර්ශන ද සිටිති.

පින්තූරය රාමුකර ලිහිනියා අවන්හලේ තබා ඇත්තේ ශ්‍රී ලංකාවේ මෑත භාගයේ සිටි ගුණ යහපත් මිනිසෙකු මෙන්ම, ලංකා දේශපාලනයේ මෑතක දුටු එක් මහත්මයෙකු ද ගෞරවයෙන් සිහිපත් කිරීම පිණිස ය.


Srilanka Information Site ශ්‍රී ලංකා තොරතුරු අඩවිය
www.srilankans.com